කැලණිය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

**බාහිර විභාග අංශය**

**වාණිජ හා කළමනාකරණ අධ්‍යයන පීඨය**

**වාණිජ විද්‍යාවේදී (විශේෂ) උපාධි දෙවන වසර පරීක්ෂණය (බාහිර) - 2010**
**2011 දෙසැම්බර් /2012 ජනවාරි**

**BCOM E 2015 – අලෙවි කළමනාකරණය**

ප්‍රශ්න සංඛ්‍යාව : 07 කාලය : පැය 03 යි

ඕනෑම ප්‍රශ්න පහකට (05) පිළිතුරු සපයන්න.

01. අ. විකුණුම් සංකල්පය සහ අලෙවිකරණ සංකල්පය අතර වෙනස පහදන්න.

(ලකුණු 04)

ආ. අලෙවිකරණ සංකල්ප පිළිබඳ ඔබගේ දැනුම භාවිතා කර " සමාජීය අලෙවිකරණ සංකල්පය යන්න විස්තර කරන්න. ඔබගේ පිළිතුර ප්‍රායෝගික නිදසුන් මගින් සනාථ කරන්න.

(ලකුණු 06)

ඇ. " ශ්‍රී ලංකාවේ බොහෝ ආයතන සමාජීය අලෙවිකරණ සංකල්පය භාවිතා කරති. " ඔබ මෙම ප්‍රකාශය සමග එකඟ වන්නේද ? ඔබගේ පිළිතුර නිදසුන් මගින් පැහැදිලි කරන්න.

(ලකුණු 10)

(මුළු ලකුණු 20)

02. අ. ආයතනයක ක්‍රියාකාරිත්වයට බලපාන ප්‍රධාන සාර්ව පාරිසරික බලවේග පැහැදිලි කරන්න.

(ලකුණු 04)

ආ. ශ්‍රී ලංකාවේ ක්ෂණික ආහාර කර්මාන්තයට බලපාන සමාජ හා සංස්කෘතික බලපෑම් කෙටියෙන් විස්තර කරන්න.

(ලකුණු 06)

ඇ. ආයතනයක අලෙවිකරණ ක්‍රියාකාරකම් සඳහා නව ඩිජිටල් විප්ලවයේ බලපෑම කෙසේදැයි විස්තර කරන්න.

(ලකුණු 10)

(මුළු ලකුණු 20)

03. අ. සඵලදායි වෙළඳපොල ඛණ්ඩනයක නිර්ණායක හඳුනාගෙන පැහැදිලි කරන්න.

(ලකුණු 04)

ආ. වෙළඳපොල ඛණ්ඩනය පිළිබඳ ඔබගේ දැනුම භාවිතා කර, අලෙවිකරුවන් පාරිභෝගික හැසිරීම අනුව වෙළඳපොල ඛණ්ඩනය කරන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න. ඔබගේ පිළිතුර ප්‍රායෝගික නිදසුන් මගින් සනාථ කරන්න.

(ලකුණු 06)

ඇ. ස්ථානගත කිරීමේ උපාය මාර්ග කෙටියෙන් විස්තර කර, ඔබ මෙම උපාය මාර්ග භාවිතා කර භාණ්ඩයක් පාරිභෝගිකයාගේ මනස තුල තැන්පත් කරන්නේ කෙසේදැයි පෙන්වන්න. ප්‍රායෝගික නිදසුනක් මගින් මෙය පැහැදිලි කරන්න.

(ලකුණු 10)

(මුළු ලකුණු 20)

04. අ. නිෂ්පාදන ජීවන චක්‍රය යන සංකල්පය විස්තර කරන්න.

(ලකුණු 04)

ආ. ඔබගේ මනාපය පරිදි නිෂ්පාදිතයක් තෝරාගෙන, එහි නිෂ්පාදන මිශ්‍රය ඇඳ එහි ප්‍රධාන නිර්ණායක කෙටියෙන් සඳහන් කරන්න.

(ලකුණු 06)

ඇ. නිෂ්පාදන ජීවන චක්‍රයක හඳුන්වාදීමේ අදියරෙහි භාවිතා කළයුතු උපක්‍රම හඳුනාගෙන පැහැදිලි කරන්න. ඔබගේ පිළිතුර නිදසුන් මගින් සනාථ කරන්න.

(ලකුණු 10)

(මුළු ලකුණු 20)

05. අ. ආයතනයක මිල කිරීමේ අරමුණු හඳුනා ගන්න.

(ලකුණු 04)

ආ. වෙළඳපොල සාරය උරාගැනීමේ මිල ක්‍රමය සහ වෙළඳපොල විනිවිද යාමේ මිල ක්‍රමය පැහැදිලි කරන්න.

(ලකුණු 06)

ඇ. මිල කිරීමේ විවිධ ක්‍රමෝපායන් හඳුනාගෙන ඔබගේ මනාපය පරිදි ශ්‍රී ලංකාවේ හෝටල් කර්මාන්තයට ගැළපෙන එක් ක්‍රමෝපායක් සාධාරණීකරණය කරන්න.

(ලකුණු 10)

(මුළු ලකුණු 20)

06. අ. සඵලදායී අලෙවිකරණ සන්නිවේදනයකදී භාවිතා කරන සන්නිවේදන මිශ්‍ර උපාංග හඳුනාගන්න.

(ලකුණු 04)

ආ. විකුණුම් ප්‍රවර්ධනය පිළිබඳව ඔබගේ දැනුම භාවිතා කර, තල්ලු කිරීමේ සහ ඇදීමේ උපාය මාර්ග සුදුසු නිදසුන් මගින් පැහැදිලි කරන්න.

(ලකුණු 06)

ඇ. ABC සමාගම ශ්‍රී ලංකාවේ ජංගම දුරකථන කර්මාන්තයට අලුතින් එක්වූ අතර, ඔවුන් විසින් සාමාන්‍යයෙන් අඩු මිලකට පෙර ගෙවුම් සහ පසු ගෙවුම් පැකේජයන් කිහිපයක් හඳුන්වාදෙන ලදී. ඔබ ABC සමාගමේ අලෙවි කළමණාකරු යැයි උපකල්පනය කර, ඔබගේ ඉලක්ක පාරිභෝගික කණ්ඩායමේ දැනුවත් භාවය ඉහළ නංවන්නේ කෙසේදැයි පැහැදිලි කරන්න.

(ලකුණු 10)

(මුළු ලකුණු 20)

07. අ. අන්සොෆ් න්‍යාසය කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 04)

ආ. මයිකල් පෝටර්ගේ මූලික උපාය මාර්ග සුදුසු නිදසුන් මගින් විස්තර කරන්න.

(ලකුණු 06)

ඇ. විවිධ උපායමාර්ගික ව්‍යාපාර ඒකක (SBU) වලට සම්පත් වෙන්කිරීම ආයතනයකට බැරෑරුම් කාර්යයකි. උපාය මාර්ගික ව්‍යාපාර ඒකක වලට සම්පත් වෙන්කිරීමේ ක්‍රම සැලකිල්ලට ගනිමින් ඉහත ප්‍රකාශය පැහැදිලි කරන්න.

(ලකුණු 10)

(මුළු ලකුණු 20)